# මිල ගණන් සඳහා ඉල්ලීමයි (RFQ)

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

# බීට්ටු වන නිලධාරී (BFO) නිල නිවාස ඉදිකිරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත, ලෝක බැංකුව වෙතින්, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියෙහි (ESCAMP) පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක් අදාල ඇමුණුම ප්‍රකාරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු වන නිලධාරී (BFO) නිල නිවාස 10 ක් (අනුරාධපුර, මාතලේ, මුලතිව්, ත්‍රිකුණාමලය, රත්නපුර, පොළොන්නරුව හා මාතර දිස්ත්‍රික්ක) ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය

02. ඒ අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) වෙනුවෙන්, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවෙහි (PPC) සභාපති විසින්, අදල ඇමුණුම ප්‍රකාරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු වන නිලධාරී නිල නිවාස ඉදිකිරීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මිළ ගණන් කැඳවනු ලැබේ. අදල කාර්ය විෂය පථයට, ඇඳීම්වල, පිරිවිතරයන්වල පරිසර කළමනාකරණ සැලසුම්වල හා ප්‍රමාණ පත්‍රවල විස්තර කොට ඇති පරිදි යාන්ත්‍රික හා විදුලිමය කාර්ය ඇතුලත්ව, බීට්ටු වන නිලධාරී නිල නිවාසවල ගොඩනැගිලිවල සිවිල් කාර්ය අයත් වේ.

අදල ඉදිකිරීම් කාලය දින 180 ක් වේ. දළ පිරිවැය ඇස්තමේන්තුව, එකක් සඳහා (වැට් හා අවිනිශ්චිත වියදම් හැර) ශ්‍රී ලංකා රුපියල් මිලියන 6.5 ක් වේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛනගතවූ අයකු නොවිය යුතු අතර පහත සඳහන් සුදුසුකම් නිර්ණායක සපුරාලිය යුතුය.

* ලංසුකරු, සීඩා ආයතනයේ (මින් පෙර ඉක්ටැඩ් ආයතනය) ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂඥතාවයේ C6 ශ්‍රේණියක ලියාපදිංචි වී සිටිය යුතුය.

04. පසුගිය වසර පහ තුළ, පවත්වාගත් ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍ය අවම වශයෙන් රුපියල් මිලියන 12 ක් විය යුතුය.

* ලංසුකරු වෙත, තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ/හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර, රුපියල් මිලියන 3 කට නොඅඩු විය යුතුය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියෙහි (ESCAMP) ප්‍රසම්පාදන අංශයෙන් 2019 නොවැම්බර් 28 වන දින දක්වා, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ ලබාගත හැක. ඉහත ලිපිනයේදී සාමාන්‍ය රාජකාරී වේලාවන් තුළ, ලංසු ලේඛණ නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක. තවද, පරීක්ෂා කොට බැලීම සඳහා පමණක්, නියැදි ලංසු ලේඛණ කට්ටලයක් www.escamp.lk වෙබ් අඩවියේ පළ කොට ඇත. (ඇමතුම් දුරකථන අංක - 011-2888426 / 011-2888427)

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු, එක් කට්ටලයක් සඳහා, රුපියල් 1500.00 බැගින් ගෙවීමෙන් හා බත්තරමුල්ලේ, රජමල්වත්ත පාරේ 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිඛිත අයදුම්පතක් සමග වලංගු සීඩා ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛණ කට්ටලයක්, 2019 නොවැම්බර් 07 වන දින සිට 2019 නොවැම්බර් 28 වන දින දක්වා පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුල, මිලදී ගත හැක. ගෙවීම්, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියෙහි (ESCAMP) ව්‍යාපෘති ගණකාධිකාරී වෙත මුදලින්ම කළ යුතුය.

07. ලංසු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ, ලංසුකරු සතුව, සීඩා ආයතනයේ (කලින් ඉක්ටැඩ් ආයතනයේ) ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂඥතාවයේ C 6 ශ්‍රේණියක වලංගු ලියාපදිංචි තිබිය යුතු අතර, එම ලියාපදිංචිය සනාථ කිරීම සඳහා සාක්ෂි ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. පිළිගත් සීඩා ලියාපදිංචිය ඉදිරිපත් නොකරනු ලබන ලංසු ප්‍රතිචාර නොදක්වූ ඒවා ලෙස සලකනු ඇත. ලංසු ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ, ලංසුකරු සතුව යාවත්කාලීන කළ, වලංගු, සීඩා ලියාපදිංචිය තිබිය යුතුය.

08. සම්පූර්ණ කළ ලංසු "මුල්පිටපත" හා "අනුපිටපත" ලෙසට පිටපත් දෙකක් වශයෙන් වෙන වෙනම මුද්‍රා තැබූ කවරවල බහා එසේ සලකුණු කොට එම කවර යළි මුද්‍රා තැබූ කවරයක බහා එහි වම් කෙළවරේ අදල කොන්ත්‍රාත් අංකය හා ඉදිකිරීම් ශීර්ෂය හා ස්ථානය හා දිස්ත්‍රික්කය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, 2019 නොවැම්බර් 29 වන දින පෙරවරු 10.00 දක්වා ලැබීමට සැලැස්විය යුතුය. එසේම ලංසු, බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියෙහි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (ESCAMP) සම්මන්ත්‍රණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමද කළ හැක. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදල භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් නිකුත් කළ "ලංසු ඇපකරය" බැගින් තිබිය යුතුය. අදල ලංසු ඇපකරයේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 75,000/- (වැට් හා අවිනිශ්චිත වියදම් හැර) වේ. එය, 2020 මැයි 29 වන දින දක්වා වලංගු විය යුතුය. වලංගු ලංසු ඇපකරයක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

10. මේ සම්බන්ධව පෙර - ලංසු හමුවක්, 2019 නොවැම්බර් 22 දින පෙරවරු 10.00 ට බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82, "සම්පත්පාය" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියෙහි (ESCAMP) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේදී පැවැත්වීමට නියමිතය. අදල වැඩබිම් පරීක්ෂාව පිළිබඳව විස්තර - ලංසු හමුවේදී දැනුම් දෙනු ඇත.

11. ලංසු 2020 අප්‍රේල් 29 වන දින දක්වා වලංගු විය යුතුය.

12. ලංසුකරුවන් විසින්, තම ලංසු සමග, PCA ආකෘති පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

13. අදල වැඩබිම් චාරිකා පිරිවැයද ඇතුලත්ව, ලංසු පිළියෙල කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී ලංසුකරුවන්ට සිදුවිය හැකි යම් පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් සේවායෝජක කිසිදු වගකීමක් දරන්නේ නැත.

14. ලැබී ඇති ලංසු, පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**ඇමුණුම - BFO නිල නිවාස 10 ක් ඉදිකිරීම**

| අනු අංකය | ව්‍යාපෘති නාමය | දිස්ත්‍රික්කය | ආපසු නොගෙවන ගාස්තු රුපියල් | ඇස්තමේන්තුගත පිරිවැය (අවිනිශ්චිත වියදම් හා වැට් හැර) රුපියල් | බැංකු ඇපකරයක් ලෙසට වූ ලංසු ඇපකරය (අවිනිශ්චිත වියදම් හා වැට් හැර) රුපියල් |
|---|---|---|---|---|---|
| 1 | කපුගොල්ලෑව - BFO නිල නිවාස ඉදිකිරීම (LK-ESCAMP-FD-107228-CW-RFQ) | අනුරාධපුර | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 2 | යකාවැව - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-107224-CW-RFQ) | අනුරාධපුර | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 3 | වාහල්කඩ - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-107226-CW-RFQ) | අනුරාධපුර | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 4 | තමන්කඩුව - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-109887-CW-RFQ) | පොළොන්නරුව | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 5 | ලග්ගල - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-109895-CW-RFQ) | මාතලේ | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 6 | වැලිඔය - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-106776-CW-RFQ) | මුලතිව් | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 7 | තුනුක්කායි - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-109909-CW-RFQ) | මුලතිව් | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 8 | කන්තලේ - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-109912-CW-RFQ) | ත්‍රිකුණාමලය | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 9 | ගොඩකවෙල - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-109886-CW-RFQ) | රත්නපුර | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |
| 10 | දෙනියාය - පිටබැද්දර - BFO නිල නිවාසය ඉදිකිරීම (LK-ESCAMP-FD-109885-CW-RFQ) | මාතර | 1,500.00 | 6,500,000.00 | 75,000.00 |

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (PPC),ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP),**
**"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**ටෙලි. 0112888426 - 0112888427**
www.escamp.lk